# අනුරාධපුර යුගයේ මුල්කාලීන කලාකෘතිවලින් නිරූපණය වන ථෙරවාද බෞද්ධ සඞ්කල්ප

මියුරු පබසර දිසානායක[1]

**හැඳින්වීම**

හෙළ ශිෂ්ටාචාරයට පදනම වූ බුදුදහම මිහිඳු හිමියන් විසින් ලක්දිවට රැගෙන එන ලද්දේ බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර දෙසිය තිස්හයකට පසුව ය. මිහිඳු හිමියන් විසින් එදා මිස්සකපව්වට වැඩම කර සපුරාලන ලද්දේ ලංකාද්වීපයට අවශ්‍ය වී තිබූ ජීවන දර්ශනය යි. ශ්‍රී ලංකාව, ථෙරවාද බුදුදහමේත් බෞද්ධ ශිෂ්ටාචාරයේත් කේන්ද්‍රස්ථානය බවට පත් වූයේ ඒ අනුව ය. ඒ අනුව බෞද්ධ දර්ශනය විවරණය කෙරෙන කලාකෘති විශාල වශයෙන් හෙළ කලාකරුවා අතින් නිර්මාණය විය. මේවායේ බහුල ව අන්තර්ගත වන්නේ දේශීය ලක්‍ෂණ යි. නමුත් ක්‍රිස්තුවර්ෂාරම්භය වන විට මේ තත්ත්වය වෙනස් වී මහායාන බෞද්ධ ලක්‍ෂණ කලාකෘතිවලට එකතු විය. කෙසේ වෙතත් මිහින්තලාවෙන් ආරම්භ වූ අනුරාධපුර මුල් කලානිර්මාණවල දැකගත හැකි වන්නේ පිරිසුදු ථෙරවාද බෞද්ධ දර්ශනය යි.

**පර්යේෂණ අරමුණ**

ලංකාවේ බෞද්ධාගම හා සම්බන්ධ ගොඩනැගිලි සහ කලාකෘති පිළිබඳ මුල්කාලීන නිදර්ශන හමු වන්නේ මිහින්තලය ප්‍රදේශයෙනි. එම නිසා මෙම අධ්‍යයනයේ දී මිහින්තලාව හා සම්බන්ධ කෘතීන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. මිහින්තලාවේ සිට සියවස් දෙකක පමණ කාලයක් යනතුරු ලාංකේය ථෙරවාද බෞද්ධ ශාසනයේ බෙදීමක් ඇති නො වීය. ක්‍රිස්තුපූර්වයෙන් පළමු සියවසේ දී **වට්ටගාමිණී අභය** (ක්‍රි.පූ. 89-77) රජු විසින් ඉදි කළ අභයගිරිය **කුපික්කල මහාතිස්ස** තෙරුන්ට පූජා කිරීම, බෞද්ධ ශාසනයේ පළමු භේදය ඇති කිරීමට හේතු විය. පසුව මහසෙන් රජ සමයේ දී මහායාන ධර්මයට රාජ්‍ය අනුග්‍රහය ද හිමි විය. මේ නිසා මුල් කාලයේ ස්තූප ආශ්‍රිත කලාකෘති සඳහා පසුකාලයේ බලපෑ මහායාන ආභාසය නිසා ඒවායේ මුල් ආකෘතිය වෙනස් විය. පූර්ව අනුරාධපුර යුගයේ කලාකෘතිවල ථෙරවාද බෞද්ධ සඞ්කල්පය විග්‍රහ කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ලංකාවේ මුල් ම බෞද්ධ කලාකෘති දැකගත හැකි වන මිහින්තලය, ථූපාරාමය වැනි ස්ථාන ආශ්‍රිත මුල්කාලීන නිර්මාණ හඳුනා ගැනීම පළමු අදියර විය. ඉන් අනතුරු ව ස්තූපය ආශ්‍රිත කලාකෘතිවල ථෙරවාද බෞද්ධ ලක්‍ෂණ හඳුනා ගැනීමත් ඒවාට පසුව එක් වූ මහායාන සඞ්කල්ප සහිත අඞ්ග වෙන්කර ගැනීමත් සිදු විය. එම තෝරා බේරා ගැනීමෙන් පසු එකී කලාකෘතිවල අන්තර්ගත ථෙරවාද බෞද්ධ සඞ්කල්පය විවරණය කිරීමට වැඩි අවධානයක් යොමු කර ඇත.

**පර්යේෂණ ගැටලුව**

[1]. සහකාර කථිකාචාර්ය, ලලිත කලා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය. *miyurumc@gmail.com*

අනුරාධපුර යුගයේ කලාව ගැන අධ්‍යයනය කිරීමේ දී පර්යේෂකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ කලාකෘතිවල ථෙරවාද බෞද්ධ ලක්‍ෂණ වෙන්කර හඳුනා ගැනීම යි. ඊට ප්‍රධාන ම හේතුව වන්නේ මුල්කාලීන ථෙරවාද බෞද්ධ සිද්ධස්ථාන පසුකාලීන ව මහායාන බලපෑම මත විවිධ වෙනස්කම්වලට ලක්වීම යි. මේ තත්ත්වය ආගමික මතවාද සඳහා මෙන් ම කලාකෘති සඳහා ද බලපාන ලදී. උදාහරණයක් ලෙස ලාංකේය ස්තූපයේ උපරිභාගයේ මුල්කාලීන ලක්‍ෂණ වර්තමානයේ දක්නට නොමැත.

**පර්යේෂණ සාහිත්‍ය සමාලෝචනය**

මෙම අධ්‍යයනයේ දී මහාචාර්ය, පරණවිතානයන්ගේ **පුරාවිද්‍යා පරියේසණ** බෙහෙවින් වැදගත් විය. මහාචාර්ය, අනුරාධ සෙනෙවිරත්නයන්ගේ **මිහින්තලාව** කෘතිය මඟින් මිහින්තලා භූමියේ කලාකෘති පිළිබඳ ව අවබෝධයක් ලැබිය හැකි විය. නමුත් මෙහි මිහින්තලාවේ මුල්කාලීන කෘති සමඟ පසුකාලීන නිර්මාණ එක්ව විස්තර කර ඇති බැවින් වෙන් කර ගැනීම අසීරු විය. මහාචාර්ය, චන්‍ද්‍රා වික්‍රමගමගේ මහතා **අනුරාධපුර පූජනීය හා රාජකීය ස්ථාන** කෘතියෙන් අභයගිරිය හා ජේතවනාරාමය ආශ්‍රිත මහායාන ලක්‍ෂණ සමහරක් හඳුනා ගත හැකි විය. නමුත් මේවායේ හඳුනා ගත් පූජාභූමිවලින් හමු වූ කලාකෘතිවල ථෙරවාද හෝ මහායාන ලක්‍ෂණ වෙන් වශයෙන් පැහැදිලි ව දක්වා නැත.

**පර්යේෂණ රාමුව**

මිහින්තලාවෙන් ආරම්භ වූ ථෙරවාද බෞද්ධ කලාකෘති නිර්මාණ සම්ප්‍රදාය සියවස් 03කට ආසන්න කාලයක් නො කඩවා පැවතුණි. වළගම්බා රජ සමයෙන් පසුව නැවත මහසෙන් කාලවකවානුව වන විට මහායාන බෞද්ධ සඞ්කල්ප වඩාත් ප්‍රචලිත වූයේ රාජ්‍ය අනුග්‍රහය ද සහිත ව ය. මේ නිසා පිරිසුදු ථෙරවාද බෞද්ධ ලක්‍ෂණ අන්තර්ගත වන කලාකෘති ඉන් පසුව හඳුනා ගැනීම අසීරු ය. ඉන් පසුව සිදු වූයේ මහායාන ධර්මයට ප්‍රමුඛස්ථානය ලැබුණු කාලවල දී මුල්කාලීන ථෙරවාද ලක්‍ෂණ සහිත කලාකෘතිවල ආකෘතිය ද වෙනස් වීම යි.

**පර්යේෂණ සාකච්ඡාව**

ලක්දිව ස්තූපයේ මුල් ආකෘතිය මිහිඳු හිමියන් ඇසින් දුටු අශෝක අධිරාජයා කළ චෛත්‍ය ආශ්‍රයෙන් ලාංකේය ශිල්පියාට විස්තර කර දුන්නා විය හැකි ය. භාරතයේ මෙන් බුදුන් වහන්සේ සඞ්කේතානුසාරයෙන් දක්වා නැතිවීමත් නිරුවත් යක්‍ෂණී රූප ලක්දිව වාහල්කඩ, මුරගල, කොරවක්ගල හා සඳකඩපහණ ආදියෙහි දක්නට නො ලැබීමත් හෙළ කලාකරුවා භාරතීය කලාව ම අනුගමනය නො කළ බවට සාක්ෂි වේ. මිහිඳු හිමියන්ගේ උපදෙස් අනුව ක්‍රි.පූ. තුන්වන සියවසේ දී පමණ ස්තූප දෙකක්වත් මිහින්තලා භූමියේ ඉදිවන්නට ඇත. එකක් නම් **කණ්ඨක චෛත්‍යය** යි. මෙම ස්තූප සාංචියේ ආකෘතියට බෙහෙවින් සමාන බව පරණවිතානයෝ පවසති.

මෙම ගර්භවල තැන්පත් කරන ලද්දේ බුදුන් වහන්සේගේ **ශාරීරිකධාතු** හෝ **පාරිභෝගිකධාතු** ය. නමුත් ස්තූපවල **ධර්මධාතු** නිදන් කිරීම ථෙරවාද සම්ප්‍රදාය නො ව මහායානික සම්ප්‍රදාය යි. ධර්ම 'ධාතු' යනුවෙන් අදහස් කරන්නේ 'ධාරණී', 'මන්ත්‍ර' හා 'සූත්‍ර' හෝ ඒවායේ කොටස් ය. මිහින්තලයේම

**ඉදිකටුසෑය** මීට උදාහරණ වේ. එයින් හමු වූ තඹතහඩුවල ඇත්තේ **පංචවිංශතිසාහස්‍රිකා ප්‍රඥා පාරමිතා** හා **කාශ්‍යප පරිවර්ත** යන මහායාන ග්‍රන්ථවල එන පාඨ බව පරණවිතානයෝ පවසති. එම අක්ෂර සමපාත වන්නේ ක්‍රි.ව. 08-09 කාලවලට නිසා ඒවා ලක්දිව මහායාන මතවාද ව්‍යාප්ත වූ කාලයක දී කරන ලද බව පෙනේ. ස්තූපවල උපරිභාග ගැන අවධානය යොමු කළ විට පෙනී යන්නේ මුල්කාලීන ස්තූප, යූපය හා ඡත්‍රයෙන් යුක්ත වූ බව යි. ඡත්‍රය ඊජිප්තුව, ග්‍රීසිය සහ මෙසපොතේමියාව වැනි ශිෂ්ටාචාරවල ද භාවිත වූ බවට සාක්ෂි තිබේ. නමුත් පසුකාලීන ව එක් වූ දේවතා කොටුව, කොත්කැරැල්ල හා කොත මහායාන ලක්ෂණ අනුව අන්තර්ගත වන්නට ඇත.

මිහින්තලයෙන් හමු වන මුල් ම කලාකෘති අතර සඳකඩපහණ විශේෂ වේ. එහි විකාශනය ද මිහින්තලයේ සඳකඩපහණ අධ්‍යයනයෙන් හඳුනා ගත හැකි ය. මෙම කෘතිය සම්බන්ධයෙන් පරණවිතානයන්ගේ මතය ප්‍රබල වුව ද ගැටලුසහගත ය. ඔහුට අනුව සංවර්ධිත සඳකඩපහණෙන් නිරූපණය වන්නේ **භවචක්‍රය** නම් එහි පියුමෙන් දැක්වෙන්නේ උතුම් නිර්වාණය යි. ථෙරවාද බෞද්ධයන්ගේ පරම අධිෂ්ඨානය වන නිර්වාණය දෙපයින් පාගාගෙන පූජාභූමියට ඇතුළු වීම ලෙස එය අර්ථකථනය කිරීම සාධාරණ නො වේ. අනෙක් අතට අනුරාධපුර යුගයේ සංවර්ධිත සඳකඩපහණ වුව ද කැටයම් අතින් ඒකාකාරී නො වේ. එකකට එකක් වෙනස් ය. මේ නිසා මුත්‍රාගල්වල කැටයම් දක්වා ඒ සියල්ල පිළිකුල් කර බැඳීම් ලිහිල් කිරීමට හුරු කළා සේ ම කැටයම් මඟින් නිරූපණය වන විසිතුරු දේ සියල්ල පයට පෑගෙන දූහුවිල්ලක් සේ අනිත්‍ය බව පසක් කළා විය හැකි ය. ඩී.ටී. දේවේන්ද්‍රයන්ට අනුව එහි නෙළුමෙන් සඞ්කේතවත් වන්නේ පා දෝවනය යි. මුරගල්වල ද සරල අවස්ථාවේ සිට සඞ්කීර්ණ අවස්ථාව දක්වා විකාශනයක් හඳුනා ගත හැකි ය. එක් සංවර්ධිත අවස්ථාවක ඉහළ කොටසේ ඉහළ සිට පහළ බලා සිටින මකර රූ සහ පහළ සිට ඉහළ බලා සිටින මකර රූ අතරමැද යෝධයෙකු හා මිථුන රූප දක්වා ඇත. එයින් අර්ථවත් වන්නේ බලසම්පන්න බවත්, සුන්දර බවත් අනිවාර්යයෙන් කාල මකරාට ගොදුරු වන බව යි.

බුදුපිළිම ගැන කතා කිරීමේ දී විසිතුරු මන්දිරවල ප්‍රතිමා තැන්පත් කිරීමේ සම්ප්‍රදායක් අනුරාධපුර මුල් යුගයේ නො තිබිණ. ජේතවනාරාමය අසල සුවිසල් පටිමාඝරයක් දැකිය හැකි වුව ද එය මහායානය වැළඳ ගත් ප්‍රථම සිංහල රජු විසින් කරවීම නිසා එය මුල්කාලීන සම්ප්‍රදාය සමඟ ගැළපිය නො හැකි ය (ජේතවනාරාමය සාගලිය නිකායේ මූලස්ථානයයි). මුල්කාලීන බුදුපිළිම බෙහෙවින් සරලය; භාවාත්මකය; ශාන්තය; (පන්කුලිය බුදු පිළිමය හා සමාධි පිළිමය). සමාධි බුදුපිළිමය වුව ද අභයගිරියට ගෙන ආවේ පසුකාලීන ව මහසෙන් රජු (ක්‍රි.ව. 276-303) විසිනි. එය මුලින් තිබුණේ **පාචීනතිස්සපබ්බත** විහාරයේ බව මහාවංසය කියයි. පිළිමයට සිරස්පතක් සවි කළ හැකි සේ සකසා ඇත්තේ පසුකාලීන ව ය.

**පර්යේෂණ නිගමනය**

මේ අනුව මිහින්තලය ඇතුළු මුල්කාලීන අනුරාධපුරයේ හමුවන කලාකෘති අතර ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය මුල් කරගත් නො ඉඳුල් කලාකෘති තෝරා බේරාගෙන විග්‍රහ කළ යුතු ව තිබේ. කෙසේ වෙතත් ථෙරවාද බෞද්ධ සංස්කෘතියේ නිජබිම වන මිහින්තලය ද ක්‍රි.ව. 04 වන සියවසෙන් පසුකාලයේ අභයගිරියේ පාලනයට නතු ව පැවතුණි. අභයගිරිය, ජේතවනය හා මිහින්තලය මහායාන පාලනය

යටතේ පැවති බව ක්‍රි.ව. 05 වන සියවසේ දී ලක්දිව සංචාරය කළ ෆාහියන් හිමිගේ දේශාටන වාර්තාවලින් ද පැහැදිලි වේ.

ඒ අනුව මෙම අධ්‍යයනයේ දී එළඹිය හැකි නිගමනයන් කිහිපයක් ඇත. එකක් නම් මුල්කාලීන ලාංකේය ස්තූප ආශ්‍රිත නිර්මාණ දේශීය හුරුවක් ගත් බව යි. එසේ ම බුදුපිළිමය ද ඉතා සරල, ධ්‍යාන සුවයෙන් වැඩ සිටින එකක් විය. ලාංකේය ස්තූපය හා සම්බන්ධයෙන් පසුකාලීන ව බෙහෙවින් ප්‍රචලිත වූ දේවතා කොටුව, කොත්කැරැල්ල හා කොත මහායාන ලක්‍ෂණ අනුව යමින් එක් වූ බව පෙනේ. මීට අමතර ව මුල්කාලීන ථෙරවාද බෞද්ධ විහාරාරාම, මහායාන බලපෑමට නතු වීමෙන් මුල් ආකෘතිය තවදුරටත් සුරක්ෂිත නො වූ බව පෙන්වා දිය හැකි ය.

**ප්‍රමුඛ පදඃ** අනුරාධපුර යුගය, කලාකෘති, ථෙරවාද බෞද්ධ සංකල්ප, මිහින්තලය

**මූලාශ්‍රය**


- දේවේන්ද්‍ර, ඩී.ටී. (2007). **සඳකඩපහණ හා වෙනත් ලිපි.** පරි.10. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- පරණවිතාන, සෙනරත් (2001). **පුරාවිදු පරියේසණ.** බොරලැස්ගමුවඃ සී/ස (පෞද්) විසිදුනු ප්‍රකාශකයෝ.
- ශ්‍රී සුමඞ්ගල නාහිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (පරි.). **මහාවංශය.**
- වික්‍රමගමගේ, චන්ද්‍රා (1995). **අනුරාධපුර පූජනීය හා රාජකීය ස්ථාන**, දෙහිවලඃ ශ්‍රී දේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
- සෙනෙවිරත්න, අනුරාධ (1993). **මිහින්තලාව.** කොළඹ 10ඃ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.
- ASCAR. 1954
- Paranavitana, Senarat. (1971). **Arts of the Ancient Sinhalese,** Colombo.